# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 ජනවාරි මස 11 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 දෙසැම්බර් මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[236 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සපයනු ලබන භාණ්ඩවල හෝ සේවාවල හෝ ආනයනය කරන භාණ්ඩවල, වටිනාකම මත වන බදු අනුප්‍රමාණය 2024 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 15% සිට 18% දක්වා වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීම සඳහා වන සීමාව, 2024 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි වාර්ෂිකව රුපියල් මිලියන අසූවේ (80) සිට රුපියල් මිලියන හැට (60) දක්වා අඩු කිරීම වේ.

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

එල්.ඩී.-ඕ. 74/2023

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක        දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (vii) වන අයිතමයේ "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/28 ක් වේ); සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/28 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (viii) වන අයිතමයේ "2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ)." යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන එහෙත් 2023 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ); සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) (viii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(ix) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට දහ අටක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 9/59 ක් වේ).".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) (vii) වන ඡේදයේ "(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු එහෙත් 2023 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (vii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"(viii) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ කරගෙන යනු ලබන සෑම තැනැත්තකුම-

(අ) යම් බදු අය කළ හැකි කාලසීමාවක් අවසානයේ දී එම තැනැත්තාගේ එම බදු අයකළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන පහළොවක් ඉක්මවා ඇත්නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන හැටක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) ඕනෑම අවස්ථාවක දී ඉදිරියේ දී එළඹෙන බදු අයකළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා සහ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම

රුපියල් මිලියන පහළොවක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉදිරියේ දී එළඹෙන මාස දොළහක කාලසීමාව තුළ දී රුපියල් මිලියන හැටක් ඉක්මවීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

-